හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජූලි11දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත්කර ඇති හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). බහුකාර්ය ගොඩනැගිල්ලේ වටිනාකම වූ රු.52,664,129ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂ එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

(ආ). බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම පිණිස දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබා ගන්නා ලද රු.16,915,039ක් වූ ණය මුදල් ලැබුණු අවස්ථාවලදී දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුමට බැර කිරීම වෙනුවට මූලධන ආධාර ලෙසට ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, සමුච්චිත අරමුදල් ගිණුම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

---

(ඈ). බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබා ගන්නා ලද ණය මුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.943,369ක ණය වාරිකය සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම හේතුවෙන් වියදම, එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

(ඇ). ඉකුත් වර්ෂ වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලට පොළිය වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.1,405,397ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ). 2012 දෙසැම්බර් 31 දිනට සභාව සතු රු.7,185,313ක් වටිනා ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොවීම නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි .

(ඊ). සභාවේ බැංකු ජංගම ගිණුම් 03ක මුදල් පොත අනුව ශේෂයත් හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ශේෂයත් අතර රු.10,606ක විචලතාවයක් විය.

(උ). 2012 දෙසැම්බර් 31 දිනට සේවක ණය ගිණුම අනුව ශේෂය රු.1,627,860ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය ගිණුමේ ශේෂය රු.1,919,299ක් වූයෙන් රු.291,439ක වෙනසක් පැවතුණි.

(ඌ). බාහිර ආයතන වලින් ලද ප්‍රතිපාදන උපයෝගී කර ගෙන සමාලෝචිත වර්ෂය තුල ඉටු කරන ලද කර්මාන්ත වලට අදාළව පැන නැගුණු රු.3,800,852ක කර්මාන්ත ණයගැතියන් සහ රු.3,492,922ක කර්මාන්ත ණයහිමි ශේෂ ලෙජරයේ සටහන් මාරුකොට සටහන් කිරීම හේතුවෙන් ණයහිමි හා ණයගැති ශේෂ රු.307,930කින් වැඩියෙන් සහ අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

---

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.70,785,501ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,426,613ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,356,211ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු. | 1,966 | 801 | 1,165 |
| (ii) | බදු කුලී. | 2,765 | 1,963 | 802 |
| (iii) | බලපත්‍ර ගාස්තු. | 1,031 | 1,031 | - |
| (iv) | වෙනත් ආදායම්. | 1,768 | 846 | 922 |

#### 2.2.2 වරිපනම් බදු.

2012 දෙසැම්බර් 31 දිනට රු.524,531ක හිඟහිටි වරිපනම් බදු මුදලක් පැවතියද ඒ සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති මාලාවේ 33 රීතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 බදු කුලී

(අ). සභාව සතු කඩ කාමර 16ක් හා සතිපොළ ගොඩනැගිල්ලේ පහත මාලය බදුදීමෙන් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ රු.542,527ක් අයකර ගැනිමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම කඩ බදු දීම සඳහා ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ). පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කර වසර 05කට වරක් එකී බදු මුදල් සංශෝධනය කළ යුතු වුවත්, සභාව සතු කඩකාමර 29ක් බදුදීමේදී පිළිගත් තක්සේරු කරුවෙකු ලවා තක්සේරු නොකර දීර්ඝ කාලයක් මුළුල්ලේ නිශ්චිත වටිනාකමකට බදුදීම හේතුවෙන් සැලකිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) 59 රීතිය ප්‍රකාරව කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා ඒ අනුව බලපත්‍ර ගාස්තු අයකළ යුතු වුවද, එම උපදෙස් අනුගමනය කර නොතිබුණි.

(ආ). විගණන නියැදි පරීක්ෂණයකට අනුව 2012 වර්ෂයේදී හඟුරන්කෙත නගරය තුල පමණක් ව්‍යාපාරික ස්ථාන 25කින් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරික්ෂණය විය.

(ඇ). 2011 හා 2012 වර්ෂවල ප්‍රදේශිය සභා බලප්‍රදේශය තුල වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරිමේ ප්‍රගතිය පිළිවෙලින් රු.427,610 ක් හා රු.297,028ක් වූයෙන් ආදායමේ 31%ක පසුබැමක් නිරීක්ෂණය විය.

(ඈ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(2) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල යම් වෘත්තියක් කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම බදු අයකළ යුතු වුවද ඒ පරිදි බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

(අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108 වගන්තියේ (ඇ) උපවගන්තිය හා 119 වගන්තියේ සහ ප්‍රාදේශීය සභාව විසින් අනුගමනය කර ඇති 1988 අගෝස්තු 23 දින අංක 520/7 දරන ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථාවේ 33(16) උපවගන්තයේ විධිවිධාන අනුව සභා බලප්‍රදේශය තුල සතිපොළ පවත්වාගෙන යාමේ නීත්‍යානුකූල අයිතිය ඇත්තේ ප්‍රාදේශීය සභාවට පමණක් වුවද, එම නීත්‍යානුකූල අයිතිය පරිදි කටයුතු නොකර රිකිල්ලගස්කඩ විවිධ සේවා සමූපකාර සමිතියට සතිපොල පවත්වාගෙන යාමට ඉඩහැරීමෙන් සභාවට වර්ෂයකට රු.533,620ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.

(ආ). සභාවේ 2011 ඔක්තෝබර් 06 දිනැති අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව කුලී රථ නැවතුම් සඳහා බලපත්‍රයක් ලබාගතයුතු වුවත්, එම අතුරු ව්‍යවස්ථා බලතල විධිමත්ව ක්‍රියාත්මක කරනොතිබූ අතර 2012 වර්ෂය තුළ සභා බල ප්‍රදේශය තුල ලියාපදිංචි ත්‍රීරෝද රථ 424න් රථ 42ක් වෙනුවෙන් මාස 06කට පමණක් බලපත්‍ර ලබාගෙන තිබුණි. මේ අනුව ත්‍රීරෝද රථ නවතා තැබීම වෙනුවෙන් ලැබිය යුතු රු.483,600ක පමණ ආදායමක් අහිමිවී තිබූ අතර, ලොරි, වෑන්, ට්‍රැක්ටර්, මොටර්රථ, අත්ට්‍රැක්ටර් සඳහා වාහන ලියාපදිංචි කිරීමට හා වාහන නවතා තැබීමේ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ බදු මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 572,151 |
| (ii) | මුද්දර ගාස්තු | 1,764,550 |

2.3 වත්කම් කළමනාකරණය.

2.3.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්.

(අ). සභාව සතු අංක 49 - 1980 දරන ට්‍රැක්ටරයක් 2010 වර්ෂයේ සිට රිකිල්ලගස්කඩ ප්‍රදේශයේ ගරාජයකට භාරදී වසර 02ක් පමණ ගතවී තිබුණද එම වාහනය අළුත්වැඩියා කර ආපසු ලබාගෙන නොතිබූ අතර, අංක 146 - 1715 දරන හොන්ඩා වර්ගයට අයත් යතුරු පැදිය ධාවනයෙන් ඉවත් කර තිබුණි.

(ආ). සභාව සතු කඩ කාමර 05ක් බදුදීමට කටයුතු කිරීමෙන් තොරව වසා දමා තිබුණි.

(ඇ). ප්‍රාදේශිය සභා බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා ලබාගත් ණය වාරික හා පොළිය ගෙවීමට වාර්ෂිකව විශාල මුදලක් වැයකර තිබියදීත්, ප්‍රාදේශීය සභා කාර්යාලයේ පහත මාලය බදු දීමට හෝ ඵලදායී කාර්යයක නොයොදා වසරකට ආසන්න කාලයක් වසාදමා තිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2012 දෙසැම්බර් 31 දිනට ස්ථානමාරු, වැඩතහනම්, විශ්‍රාම ගිය හා සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් වර්ෂ කීපයක සිට අයනොවී පවතින රු.171,761ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොකිබුණි.

(ආ). සභාවේ නිලධාරීන් සඳහා 2010 වර්ෂයේදී ලබාදී තිබූ රු.14,440ක තත්කාර්යය අතුරු අග්‍රිම පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). අංක 270 - 0497 දරන ට්‍රැක්ටර් රථයේ මයිලෝ මීටරය 2010 පෙබරවාරි 01 දින සිට ක්‍රියාවිරහිත වී පැවතියද 2013 පෙබරවාරි 11වන විටත් එය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ). සභාවේ අනුමත කාර්යය මණ්ඩලයේ තනතුරුවල පුරප්පාඩු 18ක් පැවතියද එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි

(ඉ). පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ සුන්බුන් ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය සභාවේ වාහන යොදා නොගෙන ඒ සඳහා ටිපර් රථයක් කුලියට ගැනීම වෙනුවෙන් රු.17,500ක මුදලක් ගෙවා තිබුණි.

(ඊ). සභාව සතු අංක 252 - 6568 දරන කැබ්රථයට වූ අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104(1) ප්‍රකාරව පරීක්ෂණයක් පවත්වා නොතිබුණු අතර, කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා වැයවූ රු.276,800ක මුදලින් රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූරණය වූ මුදල රු.133,983ක් පමණ වූ අතර, සිදුව තිබූ රු.142,817ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු.

(අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) (1) වගන්තිය සහ භාණ්ඩාගාර ලේකම්ගේ අංක ඩීඑම්.එස්/17/2/28 හා 2009 මැයි 25 දිනැති චක්‍රලේඛයේ දැක්වෙන උපදෙස් වලට පටහැනිව 2012 වර්ෂය තුල සේවකයින් 17 දෙනෙකු බඳවාගෙන සහා අරමුදලින් රු.2,446,591ක වැටුප් ගෙවා තිබුණි.

(ආ). 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.4 ඡේදය සහ 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ 177 වෙනි රීතියට පටහැනිව අවස්ථා 02කදී රු.522,000ක භාණ්ඩ මිලට ගෙන තිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය.

(අ). මධ්‍යම පළාත් කෘෂිකර්ම හා පාරිසරික අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.397,324ක වියදමක් දරා ඉදි කළ අපද්‍රව්‍ය වෙන්කිරීම් ගොඩනැගිල්ලේ වහලය එක් ස්ථානයකින් පහලට පහත්වී තිබූ අතර, වහලයට සවිකර තිබූ වඩිම්බු ලෑලි ක්‍රමවත් ආකාරයෙන් සවි නොකිරීම හේතුවෙන් වැසි ජලයට තෙමී දිරාපත් වෙමින් තිබුණි.

(ආ). සභාවේ නව ගොඩනැගිල්ල ඉදිරිපස කුට්ටිගල් ඇතිරීම වෙනුවෙන් රු.438,480ක් ගෙවා තිබුණද, කුට්ටිගල් අතුරන බිම් තලය තලා මට්ටම් කර නොතිබූ බව 2012 ඔක්තෝබර් 18 දින කරන ලද පරීක්ෂණයේදී අනාවරණය විය. තවද කුට්ටිගල් අතර පරතරය මි.මී. 2ක් වියයුතු වුවද ඇතැම් කුට්ටි ගල් අතර පරතරය මි.මී 05ක් පමණ විය. ගොඩනැගිල්ලට සමාන්තරව අතුරා තිබූ කුට්ටිගල් සඳහා kerbs යොදා නොතිබූ අතර, මතු පිට ගිලා බැස ඇති ස්ථානද නිරීක්ෂණය විය.

2.7 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

(අ). කෘෂිකර්ම හා පාරිසරික අමාත්‍යාංශයේ හා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2009 හා 2012 වර්ෂයේ ප්‍රතිපාදන මත රු.6,645,626ක් වැයකර අර්ධ ස්වායු අගල් ක්‍රමය අනුව කොම්පෝස්ට් අංගන 02ක් ඉදිකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා නිසි සැලැස්මක් හා ක්‍රමවේදයක් නොතිබීම, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකිවීම, ව්‍යාපෘතිය පිළිබඳ නිසි දැනුමක් හා පුහුණුවක් ලබා නොදීම යන ගැටළු නිසා මෙම ව්‍යාපෘතිය අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

(ආ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 95 වගන්තිය ප්‍රකාරව කසල නිසියාකාරව බැහැර කළ යුතු වුවද වැගම ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ 2013 පෙබරවාරි 12 දින කරන ලද පරීක්ෂාවේදී රැස්කරන ලද අපද්‍රව්‍ය, මධ්‍යස්ථානය අවට රැස්කර තිබූ අතර, එකතුවන කසළ හේතුවෙන් ප්‍රදේශයේ අධික දුර්ගන්ධයක් පැවති අතර පරිසරය දූෂණය වීම හා ජලය දූෂණය වීමටද ඉඩ තිබුණි. මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

3. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමනාකරණය.

(ඈ). කොන්ත්‍රාත් පරිපාලනය